# යෝජිත 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ලුහුඬු ප්‍රශ්නෝත්තර සංග්‍රහයක්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2020 සැප්තැම්බර්

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

## 20 වන සංශෝධනය යනු කුමක් ද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පත සඳහා වූ විසිවන සංශෝධනය (''යෝජිත සංශෝධනය'') 2020 සැප්තැම්බර් 2 වෙනි දිනැති ගැසට් අතිරේකයෙහි ප්‍රකාශයට පත් කර තිබේ (එය 2020 සැප්තැම්බර් 3 වෙනි දින මහජනතාවට ලබා ගැනීමට සලස්වා ඇත). යෝජිත සංශෝධනයෙහි ඉතාම තීරණාත්මක කාරණය වන්නේ 2015 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දහනවවන සංශෝධනයෙන් හඳුන්වා දෙන ලද බොහොමයක් දේ ඉවත් කිරීම හා 2010 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද දහඅටවන සංශෝධනයෙහි අඩංගු වන බොහෝ දේ නැවත හඳුන්වා දීම ය.

### දහනවවන සංශෝධනය පනවන ලද්දේ මන් ද?

- **විධායක ජනාධිපතිධූරයේ බලතල අඩුකර ඔහු/ඇය පාර්ලිමේන්තුවට හා අධිකරණයට වඩාත් වගකිව යුතු තත්ත්වයකට පත් කිරීමට ය.**
- **අනෙක් ඒවා අතර සාමාජිකයින් පත් කිරීමේ ක්‍රියාවලිය නිර්දේශපාලනීකරණය මගින් කොමිෂන් සභා ගණනාවක ස්වාධීනත්වය වැඩි දියුණු කිරීමට ය.**

දහනවවන සංශෝධනය සම්මත කරන ලද්දේ පාර්ලිමේන්තුවේ පුළුල් සහායකින් යුතුව මන්ත්‍රීන්ගෙන් 215 පක්ෂව ද (1 විරුද්ධව ද 1 ඡන්දය දීමෙන් වැළකී ද 7 ඡන්දය දීමට නොපැමිණීමෙන් ද) ඡන්දය දීමෙනි.

## කෙටුම්පතක් නීතියක් බවට පත් වන්නේ කෙසේ ද?

වර්තමාන යෝජිත සංශෝධනය හුදෙක් කෙටුම්පතක් පමණි. එහි තේරුම එය තවමත් නීතියක් බවට සම්මත කරනු ලැබ නොමැති බව ය. යෝජිත සංශෝධනය සම්මත කළ හැකිවනු පිණිස හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් බවට පත්වීම පිණිස සිදු විය යුතු පියවර ගණනාවක් තිබේ.

- ඕනෑම පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට දින 14 කට පෙර ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78(1) ව්‍යවස්ථාව).

- එය එහි පළමුවන කියවීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැක්කේ ඉන් පසුව ය. (මෙය විය හැක්කේ 2020 සැප්තැම්බර් 16 දිනට පසුව ය).

- පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ පටන් දින හතක් ඇතුළත ඕනෑම පුරවැසියෙකුට පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි දී අභියෝග කළ හැකි ය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව). මේ වන විටත් ඇතැම් පාර්ශව මේ ආකාරයෙන් යෝජිත සංශෝධනයට අභියෝග කිරීමට අපේක්ෂා කරන බවට යම් ඇඟවීමක් කර තිබේ.

### යෝජිත සංශෝධනයට ශ්‍රේෂ්ඨාධිකරණයේ දී අභියෝග කරනු නොලබන්නේ නම් කුමක් සිදුවේ ද?

යෝජිත සංශෝධනය පළමුවර කියවීමෙන් සතියකට පසුව දෙවනවර කියවීමක් සඳහා ගත හැකි ය. ඉන් පසුව තුන්වන වර කියවීමේ දී එයට ඡන්දය විමසනු ලබන අතර ප්‍රමාණවත් මන්ත්‍රීන් සංඛ්‍යාවක් ඊට පක්ෂව ඡන්දය දී තිබේ නම් එය නීතිය බවට සම්මත වේ. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් වන හෙයින් හා සාමාන්‍ය නීතියක් නොවන හෙයින් නීතිය බවට පත්වීමට මන්ත්‍රීන් මුළු සංඛ්‍යාවෙන් 2/3 ක් ඊට පක්ෂව ඡන්දය දිය යුතු වේ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82(5) ව්‍යවස්ථාව).

### යෝජිත සංශෝධනය අභියෝගයට ලක් කරනු ලැබුවහොත් ශ්‍රේෂ්ඨාධිකරණයේ භූමිකාව වනුයේ කුමක් ද?

අධිකරණය යෝජිත සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි යම් ආරක්ෂිත විධිවිධානයක් උල්ලංඝනය කරන්නේ ද යන්න විභාග කරනු ඇත (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව). යෝජිත සංශෝධනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි මෙම විධිවිධානයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් උල්ලංඝනය කර ඇතැයි තීරණය කරන්නේ නම් එවිට එය මන්ත්‍රීන්ගෙන් 2/3 අනුමතියට අමතරව ජනමත විචාරණයක දී ජනතාව විසින් අනුමත කරනු ලැබිය යුතු වේ. විකල්ප වශයෙන් ආණ්ඩුවට ආරක්ෂිත විධිවිධාන උල්ලංඝනය ඇතැයි ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන වගන්ති ඉවත් කර යෝජිත සංශෝධනය මන්ත්‍රීන්ගේ 2/3 ඡන්දයෙන් සම්මත කළ හැකි ය.

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යනු කුමක් ද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යනු දහඅටවන සංශෝධනය මගින් පිහිටුවන ලද පාර්ලිමේන්තු සභාව නමින් ප්‍රකට මණ්ඩලය වෙනුවට දහනවවන සංශෝධනය මගින් හඳුන්වා දෙන ලද මණ්ඩලයකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මූලික කාර්යය වනුයේ ස්වාධීන කොමිෂන් සභාවල (මැතිවරණ කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අල්ලස් කොමිෂන් සභාව හා මානව හිමිකම් කොමිෂන් සභාව වැනි) කටයුතු පවත්වා ගැනීම හා නියාමනය කිරීම ය. මෙම සභාවට  මෙම කොමිෂන් සභාවල සාමාජිකයින් ඇතුළුව වැදගත් පදවි ගණනාවකට කරන පත් කිරීම් (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාව) හා ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන්, නීතිපති හා පොලිස්පති ඇතුළු අනෙකුත් පදවිවලට කරන පත් කිරීම් (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව) පිළිබඳව සංවරණයක් ලෙස ක්‍රියා කිරීමේ වැදගත් භූමිකාවක් සහිත බහුවිධ කාර්යයන් පිළිබඳ වරයක් ලබා දී තිබේ.

සභාව බොහෝ දේශපාලන පක්ෂ ඇතුළුව පුළුල් නියෝජනයක් සහතික කරන ආකාරයකින් ව්‍යුහගත කරනු ලැබ තිබේ. සභාව කරනු ලබන පත් කිරීම් විධායක ජනාධිපතිවරයාගේ/වරියගේ තනි අභිමතයට අනුව සිදු නොවීම සහතික කිරීමේ සංවරණයක් ලෙස ක්‍රියා කරයි. මෙලෙස පත් කිරීම් ක්‍රියාවලියට දායකත්වයක් දෙමින් සභාව පත් කරනු ලබන්නා නිර්දේශපාලනීකරණයට හා එක් පුද්ගලයෙකුට හෝ එක දේශපාලන පක්ෂයකට බැඳී සිටීම අවම කිරීමට ලක් කරයි.

### පාර්ලිමේන්තු සභාවේ ව්‍යුහය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට වෙනස් වන්නේ කෙලෙස ද?

යෝජිත විසිවන සංශෝධනය දහඅටවන සංශෝධනය යටතේ පැවැති පාර්ලිමේන්තු සභාව ආපසු ගෙන ඒමට අපේක්ෂා කරයි. සභා දෙකේ ව්‍යුහයන්හි ප්‍රධාන වෙනස්කම් පහත සඳහන් පරිදි ය:

- පාර්ලිමේන්තු සභාව සමන්විත වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගෙන් පමණි (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නිර්-දේශපාලන පුද්ගලයින් තිදෙනෙකු සිටී).
- පාර්ලිමේන්තු සභාව බොහෝ දුරට සමන්විත වන්නේ  අගමැතිවරයා හා විපක්ෂ නායකවරයා අයත්වන දේශපාලන පක්ෂයේ හෝ සන්ධානවල මන්ත්‍රීන්ගෙන් පමණි.
- පත් කිරීම් ක්‍රියාවලියේ දී අනෙකුත් දේශපාලන පක්ෂ සමග අර්ථවත් අදහස් විමසීමක් නොමැතිවීම සැලකිල්ලට ගත යුතු කාරණයකි.
- පාර්ලිමේන්තු සභාව අංක 4 හා 5 සාමාජිකයින් අගමැතිවරයාගේ හා විපක්ෂ නායකවරයාගේ තෝරා ගැනීම් මත පදනම්ව ප්‍රජාවන් දෙකේ පමණක් නියෝජිතයෙකු විය හැකි  හෙයින් රටේ බහුත්වවාදී ස්වභාවයෙහි පිළිගැනීමක් නොමැත.

| සාමාජික අංකය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව | සාමාජික අංකය. | පාර්ලිමේන්තු සභාව |
|---|---|---|---|
| 1 | අගමැතිවරයා | 1 | අගමැතිවරයා |
| 2 | පාර්ලිමේන්තුවේ කථානායකවරයා | 2 | පාර්ලිමේන්තුවේ කථානායකවරයා |
| 3 | විපක්ෂ නායකවරයා | 3 | විපක්ෂ නායකවරයා |
| 4 | ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා/වරිය | 4 | අගමැතිවරයා විසින් පත් කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්/වරියක් |
| 5<br>6<br>7<br>8<br>9 | අගමැතිවරයාගේ හා විපක්ෂ නායකවරයාගේ නාම යෝජනා මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන පුද්ගලයින් 5 දෙනෙක්<br>- 2 ක් පාර්ලිමේන්තු මන්ත්‍රීන් විය යුතු ය.<br>- 3 ක් කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයින් නොවන විශිෂ්ටත්වයෙන් හා අවංකභාවයෙන් යුත් පුද්ගලයින් විය යුතුය.<br>මෙම පත්වීම් කිරීමේ දී සභාව වෘත්තීය හා සමාජ විවිධත්වය ඇතුළු ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ව ස්වභාවය පිළිබිඹු වීම සහතික කරනු පිණිස සියලු දේශපාලන පක්ෂවල අදහස් විමසිය යුතු ය. | 5 | විපක්ෂ නායකවරයා විසින් පත් කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්/වරියක්<br><br>(මෙම මන්ත්‍රීන් දෙදෙනා අනෙක් මන්ත්‍රීන් තිදෙනා අයත්වන ප්‍රජාවන්ට වෙනස් ප්‍රජාවන්ගෙන් විය යුතු ය). |
| 10 | අගමැතිවරයා හෝ විපක්ෂ නායකවරයා අයත් පක්ෂය/ස්වාධීන කණ්ඩායම නොවන මන්ත්‍රීන්ගේ බහුතරය විසින් නම් කරන්නාවූ මන්ත්‍රීවරයෙක්/වරියක් | | |

**යෝජිත සංශෝධනය පනවනු ලැබුවහොත් ප්‍රධාන පදවිවලට නිලධාරීන් පත් කරනුයේ කවුරුන් ද?**

| | **වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව** | **යෝජිත සංශෝධනය** |
|---|---|---|
| කොමිෂන් සභාවල සාමාජික සාමාජිකාවන්:<br><br>මැතිවරණ කොමිෂන් සභාව<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>ජාතික පොලිස් කොමිෂන් සභාව<br><br>මානව හිමිකම් කොමිෂන් සභාව<br><br>අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව (අල්ලස් කොමිෂන් සභාව)<br><br>මුදල් කොමිෂන් සභාව<br><br>සීමා නිර්ණ කොමිෂන් සභාව<br><br>**වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඇතුළත් කර තිබූ නමුත් යෝජිත සංශෝධනය යටතේ ඉවත් කර ඇති**<br><br>විගණක සේවා කොමිෂන් සභාව<br><br>ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව<br><br>මෙම කොමිෂන් සභාවලට පුද්ගලයින් නිර්දේශ කරන අතර ජනාධිපතිවරයා/වරිය මෙම නිර්දේශවලින් අයෙකු පත් කළ යුතු ය.<br><br>සභාව එවැනි නිර්දේශ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළු ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ව ස්වභාවය පිළිබිඹු කිරීමටඉහළම ප්‍රයත්න දැරීම අවශ්‍ය කෙරේ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඇ ව්‍යවස්ථාව) (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(3) ව්‍යවස්ථාව) . | මෙම සංශෝධනයට අනුව මෙම ප්‍රභේද දෙකටම අයත් නිලධාරීන් පත් කරනුයේ ජනාධිපතිවරයා වන අතර ඔහු/ඇය කළ යුතුව ඇත්තේ පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ අපේක්ෂා කිරීම පමණි (යෝජිත සංශෝධනය 41අ(1) ව්‍යවස්ථාව).<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මෙන් නොව පාර්ලිමේන්තු සභාවේ තීරණ සම්බන්ධයෙන් අනුගම්‍ය ඵලයක් නැති අතර ජනාධිපතිවරයාට /වරියට මෙම නිර්දේශ නොසලකා හැරිය හැකි ය. |
| අග්‍ර විනිසුරුවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරු.<br><br>අභියාචනාධිකරණයේ සභාපති හා විනිසුරුවරු.<br><br>සභාපතිවරයා හැර අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්.<br><br>නීතිපතිවරයා<br>විගණකාධිපතිවරයා<br><br>පරිපාලනය සඳහාවන පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්).<br><br>පාර්ලිමේන්තු මහ ලේකම්වරයා.<br><br>**වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඇතුළත් කරඇති**<br><br>පොලිස්පතිවරයා | මේ කාරණාවලදී ජනාධිපතිවරයා/වරිය පත්වීමක් කිරීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතිය ගැනීම අවශ්‍ය කෙරේ (41ඇ ව්‍යවස්ථාව). | විමසනු ලැබීමෙන් සතියක් ඇතුළත සභාව සිය නිරීක්ෂණ ලබා දිය යුතුව තිබෙන අතර එම කාලය ඇතුළත ඔවුන් සිය නිරීක්ෂණ ලබා නොදෙන්නේ නම් ජනාධිපතිවරයා/වරිය එම පත්වීම් කළ යුතුය (යෝජිත ව්‍යවස්ථා 41අ(8) (අ) හා (ආ) ). |

**යෝජිත සංශෝධනය ප්‍රධාන පදවිවලට පුද්ගලයින් පත් කිරීම කෙරෙහි බලපානු ඇත්තේ කෙසේ ද?**

**පාර්ලිමේන්තු සභාවට කළ හැක්කේ ''නිරීක්ෂණ'' සැපයීම පමණි, ජනාධිපතිවරයා/වරිය මෙම නිරීක්ෂණ සලකා බැලිය යුතුව තිබෙය යන්න සහතික කරන කිසිවක් එහි නැත.** මෙලෙස මෙය ජනාධිපතිවරයාට/වරියට අඩු වැඩි වශයෙන් මෙම පදවිවලට ඔහු/ඇය අභිමත පුද්ගලයින් පත් කිරීමේ බාධා විරහිත අභිමතයක් ලබා දෙන තත්වයක් ඇති කරනු ඇත. මෙය මෙම පදවි දේශපාලනීකරණයට හේතු විය හැකි අතර මෙම පදවිවල ස්වාධීනත්වයට බලපානු ඇත.

**අධිකරණයෙහි ජනාධිපතිවරයාගේ/වරියගේ මුක්තියට අදාළ වත්මන් තත්ත්වය කුමක් ද?**

දහනවවන සංශෝධනය ජනාධිපතිවරයාගේ/වරියගේ මුක්තියේ විෂය පථය අඩු කළ අතර විධායක බලය ක්‍රියාත්මක කරන විට ජනාධිපතිවරයාට/වරියට එරෙහිව මූලික අයිතිවාසිකම් අයදුම් ගොනු කිරීමට පුරවැසියන්ට ඉඩ සැලසීය (35(1) ව්‍යවස්ථාව). ජනාධිපතිවරයා/වරිය නියෝජනය කිරීමට නීතිපතිවරයා නම් කරනු ලබන හෙයින් මෙම නඩුවල දී ජනාධිපතිවරයා නම් කරනු නොලැබේ. මේ අනුව අන්‍යයන් මෙන් ජනාධිපතිවරයා අධිකරණය හමුවේ පෙනී සිටීම අපේක්ෂා නොකරන නමුත් ඔහු/ඇය නීතිපතිවරයා විසින් නියෝජනය කරනු ලබනු ඇත. හිටපු හා වත්මන් ජනාධිපතිවරයාගේ ක්‍රියා ගණනාවක් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කෙරුණ අතර දැනුදු ලක් කර තිබේ. මේවාට 2018 පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ නඩුව, පාස්කු ඉරිදා ප්‍රහාරවලට පෙර ක්‍රියා නොකිරීමට අදාළ නඩු, මරණීය දණ්ඩනය නැවත හඳුන්වා දීමට දරන ලද උත්සාහයන්ට අදාළ නඩු, ජනාධිපති සමා ගණනාවක් අභියෝගයට ලක් කිරීමේ නඩු හා විශ්‍රාම ප්‍රතිලාභයක් ලෙස ජනාධිපති සිරිසේනට 'පැජට් පාරේ මන්දිරය' ප්‍රදානය කිරීම අභියෝගයට ලක් කිරීමේ නඩුව ඇතුළත් වේ.

**යෝජිත සංශෝධනය අධිකරණයෙහි ජනාධිපතිවරයාගේ/වරියගේ මුක්තියට බලපාන්නේ කෙසේ ද?**

යෝජිත විසිවන සංශෝධනය සිවිල් හා අපරාධ නඩු යන දෙවර්ගයෙන්ම දහනවවන සංශෝධනයට පෙර ජනාධිපතිවරයා/වරිය මුක්තිය ලබන මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තත්ත්වයට ආපසු යාමට අපේක්ෂා කරයි. ඒ අනුව **පුරවැසියන් තවදුරටත් ජනාධිපතිවරයාට/වරියට එරෙහිව මූලික අයිතිවාසිකම් අයදුම් ගොනු කිරීමට හැකියාව නොලබනු ඇත.**

කෙසේ වුව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාව ආරක්ෂාව සලසන්නේ ක්‍රියාවේ කර්තෘට පමණක් මිස ක්‍රියාවටම නොවන හෙයින් මෙම මුක්තිය අදාළ කළ හැකි වන්නේ ජනාධිපතිවරයා/වරිය ධූරය දරන කාලයට අදාළව පමණක් බව කලින් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර තිබේ.

**යෝජිත සංශෝධනය අගමැතිවරයාගේ බලතල අඩු කරන්නේ ද?**

ඔව්, අගමැතිවරයාගේ බලතල සැලකිය යුතු අන්දමෙන් අඩු කරයි. පහතින් එන්නේ යෝජිත සංශෝධනය අගමැතිවරයාගේ බලතල අඩු කරනු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳව උදාහරණ සමහරකි.

- ***අගමැතිවරයා ඉවත් කිරීමේ ක්‍රියාවලිය***

වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනාධිපතිවරයාට/වරියට අගමැතිවරයා/වරිය ඒක පාර්ශවිකව ඉවත් කිරීමට ඉඩ නොදෙයි. අගමැතිවරයා/වරිය ඔහු/ඇය ඉල්ලා අස්වන තාක් හා තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීම නැවතුනහොත් (46(2) ව්‍යවස්ථාව) මිස හෝ විශ්වාස භංග යෝජනාවකින් ආණ්ඩුව පරාජයට පත් වූයේ නම් (48(2) ව්‍යවස්ථාව) මිස අඛණ්ඩව සිය ධූරය දරන්නේ ය.

**කෙසේ වුව ද යෝජිත සංශෝධනය යටතේ ජනාධිපතිවරයාට අගමැතිවරයා/වරිය ඒක පාර්ශවිකව ඉවත් කළ හැක්කේ ය (යෝජිත සංශෝධනයේ 47(අ) ව්‍යවස්ථාව).**

- **අමාත්‍යවරුන් පත් කිරීමේ දී**

අගමැතිවරයාගේ/වරියගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා/වරිය සලකන අවස්ථාවන්හි අගමැතිවරයාගේ/වරියගේ ද අදහස විමසා සිටිය යුත්තේ **<u>කොපමණ</u>** අමාත්‍යවරුන් සංඛ්‍යාවක් ද (30 හෝ අඩු සංඛ්‍යාවක සීමාවට යටත්ව) හා ඔවුන්ට වෙන් කරනු ලබන්නේ කුමන විෂයයන් හා කාර්යයන් ද යන්න වර්තමානයේ දී තීරණය කරනු ලබන්නේ ජනාධිපතිවරයා/වරිය විසිනි. (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) ව්‍යවස්ථාව).

කෙසේ වුව ද එවැනි අමාත්‍යාංශවලට **<u>අමාත්‍යවරුන්/වරියන් ලෙස පත් කළ යුත්තේ කුමන මන්ත්‍රීන් ද</u>** යන්න තීරණය කිරීමේ දී ජනාධිපතිවරයා/වරිය අගමැතිවරයාගේ/වරියගේ උපදෙස් මත ක්‍රියා කිරීම අවශ්‍ය ය.

**යෝජිත සංශෝධනය යටතේ අමාත්‍යවරුන්/වරියන් පත් කිරීමේ දී පවා අගමැතිවරයාගේ/වරියගේ අදහස් විමසීම ජනාධිපතිවරයාට/වරියට අවශ්‍ය වන්නේ ඔහු/ඇය එවැනි විමසීමක් අවශ්‍ය වන්නේ යයි සලකන්නේ නම් පමණි.**

- ***අමාත්‍යවරුන්/වරියන් ඉවත් කිරීමේ දී***

***වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අමාත්‍යවරුන්/වරියන් ඉවත් කිරීමේ දී ජනාධිපතිවරයා/වරිය අගමැතිවරයාගේ/වරියගේ උපදෙස් මත ක්‍රියා කිරීම අවශ්‍ය වන්නේ ය. (43(3) (අ) ව්‍යවස්ථාව).***

***කෙසේ වුව ද යෝජිත විසිවන සංශෝධනය යටතේ මෙම අවශ්‍යතාව ඉවත දමනු ලැබ ඇති අතර ජනාධිපතිවරයාට/වරියට ඒකපාර්ශවිකව අමාත්‍යවරයෙකු/වරියක ඉවත් කළ හැක්කේ ය ( යෝජිත සංශෝධනයේ 47(අ) ව්‍යවස්ථාව).***

**තීරණ ගැනීමේ භූමිකාවන්ගෙන් අගමැතිවරයා/වරිය ඉවත් කිරීමෙන් වන බලපෑම කුමක් ද?**

මෙම සංවරණයන් ඉවත් කිරීම ජනාධිපතිවරයාට/වරියට යටත්වන ඔහුගේ/ඇයගේ ප්‍රසාදය මත සිය පදවි දරන අමාත්‍ය මණ්ඩලයක් ඇති කරනු ඇත. මෙහි ප්‍රතිඵලය වන්නේ රට වෙනුවෙන් තීන්දු ගැනීමේ දී කිසිදු සංවරණයක් හා තුලනයක් නොමැතිව තනි පුද්ගලයෙකු තුළ අධික බලයක් ස්ථාපිත වීම ය.

**යෝජිත සංශෝධනය යටතේ කැබිනට් අමාත්‍යවරුන්/වරියන් වෙනස් වනු ඇත්තේ කෙසේ ද?**

කැබිනට් පත්වීම් අදාළව තනි අභිමතය ජනාධිපතිවරයාට/වරියට දෙනු ලැබීමට අමතරව අමාත්‍ය මණ්ඩලයේ ප්‍රමාණය හා ව්‍යුහය ද යෝජිත සංශෝධනයත් සමග වෙනස් වනු ඇත.

**දහනවවන සංශෝධනය අමාත්‍යවරුන් ලෙස පත් කළ හැකි මන්ත්‍රීන් සංඛ්‍යාව (30) ද කැබිනට් නොවන අමාත්‍යවරුන් හා රාජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව (එකතුව 40) ද සීමාවකට ගෙනා ආවේ ය** (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 46(1) ව්‍යවස්ථාව). යෝජිත සංශෝධනය මෙම සීමාව ඉවත් කරන අතර **එය ඕනෑම මන්ත්‍රීන් සංඛ්‍යාවක් අමාත්‍යවරුන්/වරියන් ලෙස පත් කිරීම හැකි කරනු ඇත.**

යෝජිත සංශෝධනය යටතේ සිදුවනු ඇති තවත් වෙනසක් වන්නේ **ජනාධිපතිවරයාට/වරියට යළිත් වරක් අමාත්‍ය කාර්යභාරයන් දැරිය හැකි වීමයි.** දහනවවන සංශෝධනය ප්‍රථම වරට ජනාධිපතිවරයාට/වරියට අමාත්‍ය කාර්යභාරයන් දැරීමට ඉඩ නුදුන්නේ ය. එය කලින් ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේනට සීමාසහිත ආමාත්‍ය කාර්යයන් දැරීමට (<u>දහනවවන සංශෝධන පනතේ</u> 51 වගන්තියට අනුව ආරක්ෂක, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශ විෂයයන් හා කාර්යයන්) සංක්‍රාන්තික විධිවිධාන සැලසීය. යෝජිත සංශෝධනය යටතේ ජනාධිපතිවරයා/වරියට තමන් වෙත ඕනෑම විෂයයක් හෝ කාර්යයක් පවරා ගත හැකි අතර ඔහු/ඇය කිසිදු අමාත්‍යවරයෙකුට/වරියකට නොපවරන ලද ඕනෑම විෂයයක හා කාර්යයක ප්‍රධානියා වශයෙන් සිටිය යුත්තේ ය (44(2) ව්‍යවස්ථාව).

**අසීමිත අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍යවරුන්/වරියන් සංඛ්‍යාවක් පත් කිරීමට ජනාධිපතිවරයාට/වරියට හැකිවීම සම්බන්ධ ප්‍රශ්නය කුමක් ද?**

පළමුවෙන්ම මෙම අමාත්‍යවරුන්/වරියන් ජනාධිපතිවරයාගේ/වරියගේ ප්‍රසාදය මත සේවය කිරීම හා ජනාධිපතිවරයාට/වරියට සම්පූර්ණයෙන්ම යටත්ව කටයුතු කිරීම ය. මෙලෙස මන්ත්‍රීන් තමන්ට පක්ෂපාතී වන තාක් දුරට ඔවුන්ට අමාත්‍යාංශයක වරප්‍රසාද ලබා දීමට ජනාධිපතිවරයාට/වරියට හැකි අතර සංවරණයෙකු ලෙස ක්‍රියා කිරීමට නොහැකි වනු ඇත.

දෙවනුව කැබිනට් අමාත්‍යවරුන්/වරියන් නව නීති යෝජනා කරන විට ඒවා සම්බන්ධයෙන් විවාද කරන්නේ හා අනුමත කරන්නේ පාර්ලිමේන්තුව ය. මන්ත්‍රීන්ගෙන් විශාල ප්‍රතිශතයක් කැබිනට් අමාත්‍ය සාමාජිකයින් වන අවස්ථාවක දී මෙය සංවරණයක් ලෙස ක්‍රියා කිරීමේ පාර්ලිමේන්තුවේ කාර්යසාධකතාව අඩු කරයි.

තුන්වනුව විශාල අමාත්‍යවරුන්/වරියන් සංඛ්‍යාවක් සිටීම රටට විශාල මූල්‍ය බරක් නිර්මාණය කරයි.

**යෝජිත සංශෝධනය යටතේ ජනාධිපතිවරයාගේ/වරියගේ පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් වන බලතල වෙනස් වන්නේ කෙසේ ද?**

දහනවවන සංශෝධනය යටතේ ජනාධිපතිවරයාට/වරියට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ කවදා ද යන්න පිළිබඳව සීමා පැනවීමක් තිබිණ. එනම් ජනාධිපතිවරයාට/වරියට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ පාර්ලිමේන්තුව එහි වසර පහක කාලයෙන් වසර හතර හමාරක් සම්පූර්ණ කිරීමෙන් පසු පමණි. ඊට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට යටත් පිරිසෙයින් මන්ත්‍රීන්ගෙන් 2/3 ක් විසින් අත්සන් කරනු ලැබ පාර්ලිමේන්තුව විසුරුවීමේ යෝජනාවක් ජනාධිපතිවරයා/වරිය වෙත ඉදිරිපත් වීම අවශ්‍ය ය (70(1) ව්‍යවස්ථාව). යෝජිත සංශෝධනය දහනවවන සංශෝධනයට පූර්වයේ පැවති තත්ත්වයට ආපසු යාමට අපේක්ෂා කරන අතර එමගින් **මහ මැතිවරණයෙන් අවුරුද්දකට පසුව ඕනෑම අවස්ථාවක ජනාධිපතිවරයාට/වරියට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි** ය (සීමිත තත්ත්වයන් ස්වල්පයකදී හැර). **එසේම යටත් පිරිසෙයින් පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගෙන් භාගයක් විසින් අත්සන් කරන ලද යෝජනාවක් මගින් ඔහුගෙන්/ඇයගෙන් ඉල්ලා සිටියහොත් වසරක් සම්පූර්ණ කිරීමට පෙර ද පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට/වරියට හැකි ය.**

ජනාධිපතිවරයාට/වරියට එය විසුරුවා හැරීමට පුළුල් බලතල ලබා දෙන හෙයින් මෙම තත්ත්වය ඔහුට/ඇයට පාර්ලිමේන්තුවට ඉහළින් පුළුල් බලයක් ලබා දෙයි. මෙය පාර්ලිමේන්තුව ජනාධිපතිවරයාගේ/වරියගේ කැමැත්තට යටත්ව ක්‍රියා කිරීමට හෝ විසුරුවා හැරීමේ අවදානමට පත්ව තිබෙන තත්ත්වයකට පත් කරන්නක් වන අතර ඒ අනුව සඵල සංවරණයක් ලෙස ක්‍රියා කිරීමේ එහි හැකියාව අවුරාලයි.

**යෝජිත සංශෝධනය නීති සම්පාදන ක්‍රියාවලිය කෙරෙහි බලපානු ඇත්තේ කෙසේ ද?**

යෝජිත සංශෝධනය නීති සම්පාදන ක්‍රියාවලියෙහි පහතින් එන වෙනස්කම් ඇති කරයි.

- ***පනත් කෙටුම්පත් සම්මත කරනු ලැබීමට පෙර ඒවා සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මහජනතාවට තිබෙන කාල සීමාව අඩු කරයි***

සාමාන්‍ය නීති හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධන සම්බන්ධ කාරණාවලදී ඒවා සම්මත කරනු ලැබීමට පෙර ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඒවායේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව අභියෝග කරන්නට පුරවැසියන්ට තවමත් පුළුවන (121 ව්‍යවස්ථාව). කෙසේ වුව ද **පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයට එය ඇතුළත් කිරීමට පෙර එය ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ යුතු අනිවාර්ය කාලය යෝජිත සංශෝධනය යටතේ සති දෙකේ සිට සතියක් දක්වා අඩුකරනු ඇත.** මෙය යෝජිත නීතියක් පාර්ලිමේන්තුවේ සම්මත කරනු ලැබීමට පෙර ඒ පිළිබඳව මහජනතාව දැන ගනු ලබන කාල සීමාව අඩු කරයි.

- ***හදිසි පනත් කෙටුම්පත් ක්‍රියාවලිය නැවත හඳුන්වා දීම***

විසිවන සංශෝධනය 'හදිසි කෙටුම්පත්' යනුවෙන් ප්‍රකට නීති වර්ගයක් ආපසු ගෙන ඒමට උත්සාහ දරයි

(යෝජිත සංශෝධනයේ 122 ව්‍යවස්ථාව). අමාත්‍ය මණ්ඩලය විසින් හදිසි හා මහජන යහපත සඳහා යයි තීරණය කළ යුතු එවැනි පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ගත් කල එවැනි නීතියක ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණයක් ලබා දෙනු සඳහා ජනාධිපතිවරයා/වරිය එය සෘජුව අග විනිසුරුවරයා වෙත යොමු කළ හැකි ය. **ශ්‍රේෂ්ඨාධිකරණය පැය 24 සිට 72 ක් ඇතුළත ඒ පිළිබඳව සිය තීන්දුව ලබා දීම අවශ්‍ය කෙරේ. එහි තේරුම ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ එවැනි නීතියක ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සිය අදහස් ඉදිරිපත් කිරීමට පුරවැසියන් සතුව පවතින අයිතිය සැලකිය යුතු ආකාරයකින් වළකා තිබෙන බව ය.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සංශෝධන හදිසි පනත් කෙටුම්පත් වශයෙන් ගෙන ඒමට නොහැකි බව (122(3) ව්‍යවස්ථාව) දක්වා ඇති හෙයින් යෝජිත සංශෝධනය දහනවවන සංශෝධනයට පෙර තත්ත්වයට ස්වල්ප වශයෙන් වෙනස් ය. දහඅටවන සංශෝධනයමත් ගෙනෙ ආවේ හදිසි පනත් කෙටුම්පතක් වශයෙනි. ඒ අනුව මෙම සීමාව ඇතුළත් කිරීම වැදගත් ය.

## යෝජිත සංශෝධනය මගින් වෙනස් කරනු නොලබන දහනවවන සංශෝධනයේ අංග තිබේ ද?

දහනවවන සංශෝධනය විසින් හඳුන්වා දෙන ලද යෝජිත සංශෝධනය යටතේ වෙනස් නොකර පවතින්නා වූ ප්‍රධාන අංග තුනක් තිබේ;

- දහනවවන සංශෝධනය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට තොරතුරු දැන ගැනීමේ අයිතිය හඳුන්වා දුනි (14අ ව්‍යවස්ථාව). යෝජිත විසිවන සංශෝධනය මෙම අයිතිවාසිකම ඉවත් කර නොමැත.

- දහනවවන සංශෝධනයට පෙර ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ සෑම වසර හයකට වරක්ම පවත්වනු ලැබිණ. දහනවවන සංශෝධනයට පසුව මෙම ඡන්ද විමසීම් දෙකම සෑම වසර 5 කට වරක්ම පවත්වනු ලැබේ (ජනාධිපතිවරයාගේ ධූර කාලය -30(2) ව්‍යවස්ථාව, පාර්ලිමේන්තුවේ වාරය -62(2) ). යෝජිත සංශෝධනය මේ තත්ත්වය වෙනස්කර නොමැත.

- දහඅටවන සංශෝධනයට පෙර ජනාධිපතිවරයා/වරිය ලෙස දෙවරක් තේරී පත්වී තිබුණු යම් තැනැත්තෙකු තුන්වන වාරයක් සඳහා තේරී පත් වීමට සුදුසුකම් නොලබන බවට (වාර දෙකේ සීමාව) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි  සීමාවක් තිබුණි. දහඅටවන සංශෝධනය මෙම සීමාව ඉවත් කළේ ය. හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂට 2015 දී තුන්වන වාරයක් සඳහා ජනාධිපතිවරණයට තරග කිරීමට හැකි වූයේ එලෙස ය. දහනවවන සංශෝධනය දෙවාර සීමාව බලගන්වමින් (31(2) ව්‍යවස්ථාව) මෙම තත්ත්වය ප්‍රතිවර්තනය කළේ ය. යෝජිත සංශෝධනය දෙවාර සීමාව තිබෙන්නට ඉඩ හරියි.

## යෝජිත සංශෝධනයත් සමග ජනාධිපති වීමට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු/වරියක වීමේ නිර්නායක වෙනස් වේ ද?

දහනවවන සංශෝධනය ද්විත්ව පුරවැසියන් ජනාධිපති බවට පත්වීමෙන් (92(ආ) ව්‍යවස්ථාව) හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීන් වීමෙන් (91(1) (xiii ව්‍යවස්ථාව) වළකාලීය. යෝජිත සංශෝධනය මෙම සීමාව ඉවත් කරයි. මේ අනුව ද්විත්ව පුරවැසියන්ට යළිත් වරක් මෙම පදවිවලට තරග කිරීමට හැකිවනු ඇත.

එසේම දහනවවන සංශෝධනය ජනාධිපති ධූරය සඳහා වන අවම වයස 30 සිට 35 දක්වා වෙනස් කළේ ය (92 (අ) ව්‍යවස්ථාව). යෝජිත සංශෝධනය මෙම තත්ත්වය ප්‍රතිවර්තනය කිරීමට අපේක්ෂා කරයි.

## යෝජිත සංශෝධනය යටතේ ස්වාධීන කොමිෂන් සභාවලට කුමක් වේ ද?

පහතින් එන්නේ යෝජිත සංශෝධනය යටතේ එන සැලකිය යුතු වෙනස්කම් ය.

- ***අල්ලස් කොමිෂන් සභාවට දී තිබුණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පිළිගැනීම ඉවත් කිරීම.***

  මෙහි ප්‍රතිවිපාකය වන්නේ අනාගත ආණ්ඩුවකට සරල බහුතරයකින් (පාර්ලිමේන්තුවේ අඩක් පක්ෂව ඡන්දය දීමෙන්) කොමිෂන් සභාව අහෝසි කිරීමට හැකිවීම ය. වර්තමානයේ දී එහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පිළිගැනීම හේතු කොට ගෙන එය අහෝසි කිරීමේ උත්සාහයකට එසේ කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගෙන් 2/3 බහුතරයක් පක්ෂව ඡන්දය දීම අවශ්‍ය කෙරේ.

- ***රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීමේ හා ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයාට/වරියට තිබේ.***

  මෙය කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට හානිකර අන්දමින් බලපාන්නා වූ හා රාජ්‍ය සේවාවේ ස්වාධීනත්වය බිඳ දැමීමේ ප්‍රතිවිපාකයක් ඇති කරන්නාවූ සංවරණය නොකෙරුණු බලයක් කොමිෂන් සභාව සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට/වරියට ලබා දෙයි. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීමට හා ඉවත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතිය අවශ්‍ය කෙරේ.

- ***අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීමේ තනි බලය ජනාධිපතිවරයාට/වරියට තිබේ.***

  යෝජිත සංශෝධනය යටතේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා ප්‍රථම අවස්ථා අධිකරණයක විනිසුරුවරයෙකු/වරියක වශයෙන් සේවය කිරීමේ අධිකරණමය පලපුරුද්ද නොසලකා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් දෙදෙනෙකු අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින් ලෙස පත් කිරීමට ජනාධිපතිවරයාට/වරියට හැකි ය. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පත්වීම් කිරීමේ දී විනිසුරුවන්ගේ ජ්‍යෙෂ්ඨත්වය සලකා බැලිය යුත්තේ කෙසේ දැ යි පැහැදිලිව දක්වයි (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ ව්‍යවස්ථාව). ජනාධිපතිවරයාට/වරියට පාර්ලිමේන්තු සභාවේ අනුමත කිරීමේ අවශ්‍යතාවෙන් තොරව එවැනි සාමාජිකයින් පත් කිරීම හෝ ඉවත් කිරීම කළ හැකි ය.

- ***මැතිවරණ කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම***

  යෝජිත සංශෝධනය මැතිවරණ හෝ ජනමත විචාරණයක් පැවැත්වීම හා සෘජුවම සම්බන්ධ විෂය කාරණා සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන උපමාන සීමා කරන 104ආ(අ)(i) ව්‍යවස්ථාව හඳුන්වා දීමට අපේක්ෂා කරයි. රාජ්‍ය සේවයට සම්බන්ධ හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන සීමාව තුළට වැටෙන කිසිදු කාරණයකට අදාළව උපමාන නිකුත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය නොපවරනු ඇත.

- ***ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම***

  මෙය දහනවවන සංශෝධනය (156ආ සිට 156ඌ දක්වා ව්‍යවස්ථා) මගින් හඳුන්වා දෙනු ලැබූ අතර යෝජිත සංශෝනය යටතේ අහෝසි කරනු ඇත.

මෙම සියල්ල ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් ඇතුළත විනිවිදභාවය සහ සාධාරණත්වය සහතික කරන වැදගත් කොමිෂන් සභා වන අතර යෝජිත සංශෝධනය ඒවායේ ස්වාධීනත්වයට බලපානු ඇත.

## ජනාධිපතිවරයා විසින් පත් කරන ලද විශේෂඥයින්ගේ කමිටුව හා මෙම සංශෝධනය අතර සම්බන්ධයක් තිබේ ද?

මාධ්‍ය වාර්තාවලට අනුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක මූලික කෙටුම්පතක් සම්පාදනය කරනු සඳහා ජනාධිපතිවරයා විසින් 2020 සැප්තැම්බර් 2 වෙනි දින විශේෂඥයින්ගේ කමිටුවක් පත්කර තිබේ. විසිවන සංශෝධනය විශේෂඥයින්ගේ කමිටුව විසින් සම්පාදනය කරන ලද කෙටුම්පතක් නොවේ, කමිටුව පත් කරන ලද්දේ පනත් කෙටුම්පත ගැසට් කරන ලද දිනයේදීම ය.